## ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය - 2014

ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතන පනතේ 14(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2015 ජූලි 14 දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

දේශීය හා විදේශීය ප්‍රදාන යටතේ ලැබී තිබූ රු.19,124,005 ක් වටිනා වත්කම් මූල්‍ය ප්‍රදාන ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

2.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.23,531,375 ක්වූ ලැබිය යුතු ශේෂයෙන් රු.1,262,808 ක් වසර 2 කට වැඩි කාල පරිච්ඡේදයක සිට හා රු. 2,226,928 ක් වසර 5 කට වැඩි කාලයක සිට හිඟව පැවතුණි. තවද මෙම ණය අයකර ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් ආයතනය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේදී ආයතනය පිහිටුවීමේදී ඒකාබද්ධ කරන ලද පේෂකර්ම අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානයේ ගිණුම්වලින් ඉදිරියට ගෙන එන ලද එකතුව රු.290,441 ක් වූ ලැබිය යුතු භාණ්ඩ හා සේවා බදු මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණද, එය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 ජූනි 17 දින ආයතනය විසින් රාජ්‍ය සමාගමක් වෙත තාවකාලිකව මුදා හරිනු ලැබූ රියදුරෙකු සඳහා ආයතනය විසින් 2014 පෙබරවාරි මාසය සඳහා ගෙවනු ලැබූ වැටුප් රු.43,280 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ සිට පැවත එන එකතුව වූ රු. 90,431 ක් වූ වෙළඳ ණයගැතියන්ගෙන් වැඩිපුර ලද මුදල් වර්ෂය අවසාන වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 104 (1) | සමාලෝචිත වර්ෂයේදී ආයතනය සතු ලැප්ටොප් පරිගණක 02 ක් හා 2012 වර්ෂයේ ලැප්ටොප් පරිගණකයක් අස්ථානගතවී තිබුණද, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා වූ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි. |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |

2.5 **ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරණ ජාතික අයවැය චක්‍රලේඛයේ 2.1.5 වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩලය හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව, ඉංජිනේරු දීමනා, පාඨමාලා සම්බන්ධීකරණ දීමනා, ලේකම් දීමනා හා ගණකාධිකාරී දීමනා ලෙස එකතුව රු. 2,924,519 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.46,235,869 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 41,840,235 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.4,395,634 ක වාසිදායක වර්ධනයක් විය. පෞද්ගලික පඩිනඩි, අලුත්වැඩියා හා නඩත්තු වියදම්, ගිවිසුම්ගත සේවා, ක්ෂය හා ක්‍රමක්ෂය හා වෙනත් වියදම් ඇතුළුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම එකතුව රු. 24,065,338 කින් වැඩිවී තිබුණද මුළු මෙහෙයුම් ආදායම රු.31,274,854 කින් වැඩි වී තිබීම මූල්‍ය ප්‍රතිඵලයේ වාසිදායක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පේෂකර්ම හා ඇඟළුම් නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා පුද්ගලයින් පුහුණු කිරීම, පරීක්ෂණ හා උපදේශන කාර්යයන් වැනි සේවාවන් ඉටු කිරීම ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන අතර එම කාර්යයන් ඉටු කිරීමේ කාර්ය සාධනය ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| කාර්යය | **2014** | **2013** | **සමාලෝචිත වර්ෂයේ වැඩිවීම/(අඩුවීම)** | **වැඩිවීම හා (අඩුවීම) ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| **<u>පුහුණු කිරීම්</u>** | | | | |
| පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 24 | 38 | (14) | (37) |
| සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 372 | 363 | 9 | 2 |
| පුහුණු පාඨමාලා ආදායම (රු. මිලියන) | 13.34 | 15.47 | (2.13) | (14) |
| **<u>බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීම අනුව</u>** | | | | |
| පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව | 120 | 141 | (21) | (15) |
| සහභාගී වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 3,947 | 3,067 | 880 | 29 |
| පුහුණු පාඨමාලා ආදායම (රු. මිලියන) | 42.94 | 30.89 | 12.05 | 39 |
| **<u>පරීක්ෂණ</u>** | | | | |
| පරීක්ෂණ සංඛ්‍යාව | 65,031 | 60,965 | 4,066 | 7 |
| පරීක්ෂණ ආදායම (රු. මිලියන) | 83.58 | 75.43 | 8.15 | 11 |
| **<u>උපදේශාත්මක සේවා</u>** | | | | |
| උපදේශාත්මක සේවා සංඛ්‍යාව | 16 | 45 | (29) | (64) |
| උපදේශාත්මක සේවා ආදායම (රු. මිලියන) | 1.1 | 5.46 | (4.36) | (80) |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව පාඨමාලා 100 ක් පැවැත්වීම සඳහා සිසුන් 1,300 ක සහභාගිවීමක් අපේක්ෂා කළද, වර්ෂය අවසන් වන විට පාඨමාලා 24 ක් පමණක් පවත්වා තිබූ අතර, ඒ සඳහා සිසුන්ගේ සහභාගිත්වය 372 ක් වී තිබුණි. එය අපේක්ෂිත සිසු සංඛ්‍යාවට වඩා සියයට 71 ක අඩුවීමක් වූ අතර ඒ හේතුවෙන් පාඨමාලා ආදායමද ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 2.13 කින් හෙවත් සියයට 14 කින් අඩු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී බාහිර පාර්ශවයන්ගේ ඉල්ලීම අනුව පවත්වන ලද පාඨමාලා සංඛ්‍යාව පෙර වර්ෂයට වඩා 21 කින් අඩුවී තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී පාඨමාලා ගාස්තු වැඩිකිරීම හේතුවෙන් පාඨමාලා ආදායම රු. මිලියන 30.89 සිට රු.මිලියන 42.94 දක්වා සියයට 39 කින් වැඩි වී තිබුණි.

(ඇ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුල පවත්වනු ලැබූ උපදේශාත්මක සේවා සංඛ්‍යාව පෙර වර්ෂය හා සැසඳීමේදී 29 කින් අඩු වී තිබූ අතර උපදේශාත්මක සේවා ආදායමද රු. මිලියන 4.36 කින් හෙවත් සියයට 80 කින් අඩු වී තිබුණි.

(ඈ) ආයතනය විසින් සැලසුම් කරන ලද පාඨමාලා පැවැත්වීම පිළිබඳ වගකිව යුතු නිලධාරීන් ක්‍රියාකාරී සැලසුමේ දක්වා තිබුණද, පාඨමාලා පැවැත්වීම ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව සිදු වී නොතිබුණි. කෙසේ වුවද, ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා පාඨමාලා සංවිධානය කිරීම ක්ෂේත්‍රයේ නියුතු වූවන් අතර, ප්‍රවර්ධන වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම ආයතනයේ ප්‍රධාන වගකීමක් වුවද, කළමනාකාරීත්වය ඒ සඳහා අවධානය යොමු කර නොතිබුණි.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**--------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය වෙත ප්‍රදානයක් ලෙස වර්ෂ 18 කට පෙර ලැබී තිබූ වාහන 02 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී උපචිත වියදම් යටතේ දක්වා තිබූ රු. 822,480 ක් වත්කම් ප්‍රත්‍යාගණන වාර්තා ලබා ගැනීමකින් තොරව 2015 වර්ෂයේදී අදාල පාර්ශවය වෙත ගෙවා තිබුණි.

(ඇ) රාජකාරී අවශ්‍යතාවය පැහැදිලිව දක්වා අදාල අංශ ප්‍රධානීන්ගෙන් පූර්ව අනුමැතිය මත අත්‍යවශ්‍ය හා විශේෂ අවස්ථාවලදී පමණක් නිලධාරීන් අතිකාල සේවයේ යොදවා ගත යුතු වුවද, එසේ සිදුනොකර ආයතනයේ නිලධාරීන් සතියේ දිනවල අතිකාල සේවයේ යෙදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආයතනය විසින් එකතුව රු.1,294,228 ක් වූ මුදල් වැයකර තිබුණි.

(ඈ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයෙන් ලබාදෙන ප්‍රතිපාදන මත ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය විසින් පුහුණු ව්‍යාපෘති 03 ක් නිසි සැලසුමකින් හා අදාල ගිවිසුම්වලට එළඹීමකින් තොරව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු. 2,644,990 ක් වැයකර තිබුණි.

4.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ලද ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය තුලදී එකතුව රු. 7,729,008 ක් වැයකර තිබුණද, අදාල සමාලෝචන කමිටු තුලින් මෙම වැඩසටහන් අධීක්ෂණය හා ප්‍රගතිය පරීක්ෂා කිරීම සිදුකර නොතිබුණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලද එක් ආයතනයක් අතරමඟදී ඉවත්වීම නිසා එම ආයතනය වෙනුවෙන් වැයකරන ලද රු.1,500,000 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) 2009 අංක 12 දරන ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතන පනතේ 12 (1) වන වගන්තිය මගින් ආයතනයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව සහ දැනුම වර්ධනය කිරීමේ කාර්යය සඳහා ආයතනය විසින් කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදලක් පිහිටුවිය යුතු බව දක්වා තිබුණි. එසේ

වුවත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වගන්තිය ප්‍රකාරව කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල පිහිටුවා නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අරමුණුවලට අදාල නොවන පුවත්පත් දැන්වීමක් පළකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.154,000 ක් වැයකර තිබුණි.

(ආ) රජයේ ආයතනයන් සඳහා උපදේශකයින් තෝරා ගැනීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව සිදුකළ යුතු වුවත්, එයට පටහැනිව ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු, පර්යේෂණ හා පුහුණු ඒකකයේ උපදේශකවරයකු ලෙස පත්කොට සමාලෝචිත වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා රු. 1,317,000 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

සමාලෝචිත වර්ෂය තුළදී ජේෂකර්ම හා ඇඟළුම් ක්ෂේත්‍රයට අදාළ විශේෂ වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ලබාදුන් මුදලින් රු.10,786,220 ක් අදාළ වැඩසටහන් සඳහා උපයෝජනය කර නොතිබුණි.

**4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේදී රු. 1,518,560 ක මුදලක් වැයකොට ගේට්ටුවක් සහ ආරක්ෂක මුර කුටියක් ඉදිකොට තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් මෙම ගේට්ටුව සහ මුරකුටිය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) ආයතනය විසින් භාවිතා කරන ලද වාහන 02 ක් අපහරනය කිරීම සඳහා 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් නිර්දේශ කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම වාහන 02 ක අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පිරිවැය රු. 296,539 ක් වූ ඩීසල් ටැංකිය 2012 වර්ෂයේදී රු. 109,920 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඈ) විදේශාධාර යටතේ ලැබී තිබූ පිරිවැය රු. 1,356,195 ක්වූ යන්ත්‍ර අමතර කොටස් භාවිතයට ගැනීමකින් තොරව වසර 17 ක් තිස්සේ ගබඩාවේ රඳවා තිබුණි.

**4.7 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් ආයතනයේ සම්පත්**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව 2012 වර්ෂයේදී ආයතනය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලබාදී තිබුණු රු. 7,500,000 ක් වටිනා කැබ් රථය රේඛීය අමාත්‍යාංශයේ භාවිතය සඳහා 2013 සැප්තැම්බර් 04 දින නිදහස් කොට තිබියදී එම වාහනයේ අලුත්වැඩියා වියදම් ලෙස එකතුව රු. 910,472 ක් ආයතනය විසින් වැයකර තිබුණි.

4.8 **ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලයේ සඳහන්ව නොමැති, වෙළඳ උපදේශක තනතුරක් සඳහා බඳවා ගැනීමට දැන්වීමක් පළකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 49,140 ක් වැයකර තිබුණද බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

(ආ) ආයතනය විසින් නිලධාරීන් හට කණ්ඩායම් ප්‍රවාහන සේවා සැපයීමේදී අදාල ගමනාන්තය අවසානයේදී වාහනය, ආයතන ප්‍රධානියා තීරණය කරන ස්ථානයක නවතා තබනු වෙනුවට වාහන 02 ක් නැවත ආයතනය වෙත නිකරුනේ ධාවනය කර තිබුණි. මේ නිසා සමාලෝචිත වර්ෂයට අදාලව මේ වෙනුවෙන් වූ ඉන්ධන හා අනෙකුත් වියදම් රු.817,950 ක් දරා තිබූ අතර රාත්‍රී ගමනාන්තය අවසානයේදී වාහනය ඉහත පරිදි නතර කර තැබුවේ නම් මෙම වියදම් අඩකින් පමණ අඩුකර ගත හැකිව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය

(ඇ) ආයතනය වෙනුවෙන් මන්නාරමේ ශාඛාවක් පිහිටුවීම සඳහා 2014 දෙසැම්බර් 31 දිනට රු.1,121,259 ක් වැයකර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ශාඛාව නිෂ්කාර්ය තත්ත්වයේ පැවති අතර, මෙම ශාඛාව නඩත්තුව සඳහා රු.160,000 කට අධික වියදම් මාසිකව දරනු ලබන බව නිරීක්ෂණය වූයෙන්, එම වියදම් අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය.

4.9 **කාර්ය මණ්ඩල පරිපාලනය**

මැතිවරණ කොමසාරිස්වරයාගේ 2014 නොවැම්බර් 26 දිනැති අංක පී. ආර්. ඊ. 2015/4 සී දරන චක්‍රලේඛනයේ 03 වගන්තිය අනුව තාවකාලික බඳවා ගැනීම් ජනාධිපතිවරණ කාලයේදී සිදුකිරීමෙන් වැලකිය යුතු බව සියලුම සංස්ථා සභාපතිවරුන් වෙත දන්වා තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩලයේ හා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය රහිතව හා විධිමත් පත්වීම් ලිපි නිකුත් කිරීමකින් තොරව ආයතනය විසින් තාවකාලික පදනම මත පුහුණුවන්නන් 06 දෙනෙකු බඳවාගෙන 2014 දෙසැම්බර් මාසය සඳහා එකතුව රු. 77,025 ක් වූ දීමනා ගෙවා තිබුණි.

5. **ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය**

5.1 **අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර, අභ්‍යන්තර විගණන විමසුම් 2 ක පිටපත් පමණක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි. වර්තමානයේ අභ්‍යන්තර විගණනය සඳහා නිලධාරිනියක් පමණක් සේවයේ යොදවා තිබුණු අතර, ඒ සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පත්කර ඵලදායි විගණනයක් සිදුකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

5.2 **ප්‍රසම්පාදන සැලැස්ම**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ), (ආ), (ඇ) හා (ඉ) ප්‍රකාරව, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කොට ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු බව හා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස 06 කට වැඩි නොවන කාලයක් තුල යාවත්කාලීන කළ යුතු බව දක්වා ඇති නමුත් ආයතනය ඒ අනුව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කොට නොතිබුණි.

5.3 **අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී , සියයට 02 සිට සියයට 83 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.4 **නොවිසඳී ඇති විගණන ඡේද**

2012 ඔක්තෝබර් 16 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝගය පරිදි ඇඟළුම් කර්මාන්තය පිළිබඳව විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීමට අවධානය යොමු කළ යුතු බව අවධාරණය කර තිබුණද, ආයතනය විසින් පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් පිහිටුවා තිබුණු නමුත්, ඇඟළුම් ක්ෂේත්‍රය පිළිබඳ මූලික සමීක්ෂණයක් සිදුකිරීමට පියවර ගැනීම හැර වෙනත් කටයුතු කිසිවක් මෙම ඒකකයෙන් සිදුකර නොතිබුණි.

5.5 **පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

ආයතනයට අදාල පාරිසරික හා සමාජ වගකීම් කවරේද යන්න ආයතනය විසින් හඳුනාගෙන නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) ණයගැති හා ණයහිමි පාලනය
(ඇ) වත්කම් පාලනය
(ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඉ) ගබඩා පාලනය
(ඊ) පාඨමාලා සංවිධානය